ශීර්ෂය - 001 අතිගරු ජනාධිපති - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 001 අතිගරු ජනාධිපති 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අතිගරු ජනාධිපති කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 ජූනි 26 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11 (2) වගන්තිය ප්‍රකාරව අතිගරු ජනාධිපති කාර්යාලයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 අගෝස්තු 06 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අතිගරු ජනාධිපති කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව අතිගරු ජනාධිපති කාර්යාලයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව අතිගරු ජනාධිපති කාර්යාලයේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අතිගරු ජනාධිපති කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අතිගරු ජනාධිපති කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 අග්‍රිම කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා රු.35,180,492,000 ක අග්‍රිම සැලසුම් කර රු.34,968,065,000ක අග්‍රිම ඉල්ලුම් කර තිබුණද සත්‍ය වශයෙන් ලද අග්‍රිමය රු.3,918,119,000ක් විය. ඒ අනුව ලද අග්‍රිමය සැලසුම් කළ හා ඉල්ලුම් කළ අග්‍රිමයෙන් සියයට 11 ක් වී තිබුණි. තවද, කාර්යාලය විසින් මාස හතරකදී සැලසුම් කළ අග්‍රිමයට වඩා වැඩියෙන් භාණ්ඩාගාරයෙන් අග්‍රිම ඉල්ලුම් කර තිබුණි.	අනුමත අයවැය ඇස්තමේන්තුව අනුව මාසික අග්‍රිම අවශ්‍යතාවය සැලසුම් කර භාණ්ඩාගාරයෙන් අග්‍රිම ඉල්ලුම් කිරීමේදී මාසිකව වැය වෙතැයි අපේක්ෂා කරනු ලබන අවශ්‍යතාවය පමණක් ඉල්ලුම් කරනු ලබයි. භාණ්ඩාගාරය විසින් අග්‍රිම නිදහස් කරනු ලබන්නේ ගෙවීම් සඳහා සෑම අතින්ම සම්පූර්ණ වවුචර් සඳහා පමණක් වන බැවින් මාසිකව ඉල්ලුම් කරනු ලැබූ සහ භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිම ප්‍රමාණය අතර වෙනසක් පවතී.	අවශ්‍යතාවය හඳුනාගෙන තාත්විකව අග්‍රිම සැලසුම් කළ යුතුවීම

3.2 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ක්‍රියාකාරී සැලසුමට අනුකූලවන පරිදි වියදම් ඇස්තමේන්තු සකස් කර ප්‍රමාණවත් හා වඩාත් නිවැරදිව ප්‍රතිපාදන වෙන් කරවා නොගැනීම හේතුවෙන් වැය විෂයයන්වලට	නව මිලදී ගැනීම් සීමා කිරීම, ඇස්තමේන්තුගත ප්‍රතිපාදන සීමාව තුල වියදම් ඉදිරිපත් නොවීම, අපේක්ෂිත පරිදි වැඩසටහන් ක්‍රියාත්මක නොවීම, සංවර්ධන කාර්යයන් ඉටුකිරීම සඳහා ප්‍රතිපාදන සලසා ගත්තද, ඊට	අවශ්‍යතාවට අනුකූලව තාත්වික ඇස්තමේන්තු සකස් කළ

	අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩියෙන් ප්‍රතිපාදන සලසා ගෙන වැය විෂයන් පහක වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදනයවූ රු.1,353,000,000ක් වැය නොකර සම්පූර්ණයෙන්ම ඉතිරි කර තිබුණි.	අදාල ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් නොවීම යන හේතූන් මත ප්‍රතිපාදන ඉතිරි වී ඇත.	යුතුවීම.
(ආ)	වැය විෂයන් 11ක මුදල් රෙගුලාසි 66 මඟින් වෙනත් වැය විෂයයකට ප්‍රතිපාදන මාරු කළ පසුද, ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 සිට 73 දක්වා පරාසයක ඉතිරි වී තිබුණි.	නිල විදේශ සංචාර සීමාවීම, අත්‍යාවශ්‍ය ගොඩනැගිලි සුළු අලුත්වැඩියා හා නඩත්තු වියදම් පමණක් සිදුකිරීම, බලාපොරොත්තු වූ වියදම් ඉදිරිපත් නොවීම, ඉන්ධන මිල, වාහන පරිහරණය, සංග්‍රහ හා වෙනත් වියදම් අඩුවීම, ආයතනයේ අභ්‍යන්තර සම්පත් යොදාගෙන මෘදුකාංග වැඩිදියුණු කිරීම, සන්නිවේදන කටයුතු විද්‍යුත් තාක්ෂණය ඔස්සේ කිරීම, සහයෝගීතා ගිවිසුම වෙනුවෙන් වූ රජයේ දායකත්ව ප්‍රතිශතය අඩුවීම, පැවති අයහපත් කාලගුණික තත්වය, නිලධාරීන් මැතිවරණවල රාජකාරීවල නිරතවීම, නව රජය පත්වීමෙන් පසු ආරම්භ කර නොමැති සංවර්ධන ව්‍යාපෘතීන් නතර කිරීම වැනි හේතූන් නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඇත.	එම
(ඇ)	වැය විෂයන් 23ක ඇස්තමේන්තු ප්‍රතිපාදනයවූ රු.5,562,000,000න් සියයට 30 සිට 98 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.	ජනාධිපති කාර්යාලයේ තාවකාලික කාර්යය මණ්ඩලයෙහි පත්වීම් අවසන් කිරීම, ගමන් වියදම් වවුචර් ඉදිරිපත් නොවීම, වැඩසටහන් නොපැවැත්වීම, පිරිමැසුම්දායීව සම්පත් උපයෝජනය, කල් බදු කුලී ගිවිසුම් අවසන් වීම, ඉතා අත්‍යාවශ්‍ය නඩත්තු කටයුතු පමණක් කාර්යක්ෂමව සිදුකිරීම, කාර්යාල පරිශ්‍රයෙන් පිටත පැවති අංශයන් වසා දැමීම හෝ ප්‍රධාන කාර්යාල පරිශ්‍රය තුල ස්ථානගත කිරීම, නව මිලදී ගැනීම් සීමා කිරීම, ආයතනයේ අභ්‍යන්තර සම්පත් යොදාගෙන මෘදුකාංග වැඩිදියුණු කිරීමත්, අයහපත් කාලගුණය මැතිවරණ රාජකාරී කටයුතුවල නිලධාරීන් නිරතවීම, ආරම්භ කර නොමැති සංවර්ධන ව්‍යාපෘතීන් නතර කිරීම, තරුණ අභිවෘද්ධි සඳහා ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් නොවීම වවුචර්වල අඩුපාඩු හේතුවෙන් ගෙවීම් නොකිරීමත් යන හේතූන් නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඇත.	එම

(ඈ)	වැය විෂයන් 16ක් සඳහා වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදනයට අමතරව මු.රෙ.66 මඟින් රු.1,601,625,118ක ප්‍රතිපාදන සලසාගෙන සියයට 25 සිට 400 ක් දක්වා පරාසයක මුදල් ප්‍රතිපාදන වැඩි කරගෙන තිබුණි.	වාහන අලුත්වැඩියා පිරිවැය ඉහළ යාම, ප්‍රවාහන දීමනා ලබා ගන්නා නිලධාරීන්ගේ ඉහළ යාම, ජනාධිපති ආරක්ෂක නිලධාරීන්ගේ පිරිවැය ඉහළ යාම, ප්‍රාග්ධන ස්වරූපයේ අලුත්වැඩියා අමතර කොටස් මිළ වැඩිවීම, වෙනත් සැපයුම් වියදම් ඉදිරිපත් වීම සහ මිල ඉහළ යාම, අධිකරණ තීන්දු මත හිඟ නිවාස බදුකුලී ගෙවීම, විවිධ පළාත්වල වැඩසටහන් සඳහා විවිධ සේවා සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම, අලුත් කාර්යාල පරිශ්‍ර සඳහා ආරක්ෂක සේවා සැපයීම, දමිළ භාෂා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, නව කාර්යාල උපකරණ මිලට ගැනීම, 2023 වර්ෂයට අදාල ප්‍රදානයක් 2024 වර්ෂයේදී ගිණුම් තැබීම, ලෝක ආහාර වැඩසටහන යටතේ ආහාර හා අනෙකුත් ව්‍යාපෘති සඳහා ප්‍රදාන ලැබීම් සඳහාත් අමතර ප්‍රතිපාදන සලසා ගන්නා ලදී.	එම
(ඉ)	වැය විෂය අංක 001-2-6-3-2509 සංවර්ධන මූලාරම්භ සම්බන්ධීකරණය සහ අධීක්ෂණය සඳහා වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදනය රු.500,000,000ක් වූ අතර පරිපූරක ඇස්තමේන්තු මඟින් රු.1,000,000,000ක් හා පාර්ලිමේන්තු අතිරේක ප්‍රතිපාදන මඟින් රු.8,750,000,000ක් වශයෙන් එකතුව රු.9,750,000,000ක අමතර ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. අතිරේකව සලසාගත් ප්‍රතිපාදන ප්‍රමාණය ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 1,950ක් වී තිබුණි.	වාර්ෂික අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදන ප්‍රමාණයන්ට වඩා ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා ප්‍රතිපාදන ඉල්ලීම් ඉදිරිපත් වී තිබීම හේතුවෙන් අමාත්‍ය මණ්ඩල තීරණ අනුව වැය විෂය අංක 001-2-06-003-2509 සඳහා රු.මි. 1,000ක හා වැය විෂය අංක 001-2-006-023-2509 සඳහා රු.මි. 21,000ක අමතර ප්‍රතිපාදනයක් සහ ජනාධිපති වැය ශීර්ෂය යටතේ වැඩසටහන් අංක 024, 025, 026, 027, 028, හා 032 සඳහා වෙන්වී ඇති ප්‍රතිපාදනයන්හි ඉතිරිවීම් රු.මි.8,750ක් අමාත්‍ය මණ්ඩල තීරණය අනුව වැය විෂය අංක 001-2-06-003-2509 සඳහා මාරු කරන ලදී.	අවශ්‍යතාවට අනුකූලව තාත්විකව ඇස්තමේන්තු සකස් කළ යුතුවීම
(ඊ)	වාර්ෂික ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයට අමතරව මු.රෙ.66, පරිපූරක ඇස්තමේන්තු හා පාර්ලිමේන්තු අතිරේක ප්‍රතිපාදන මඟින් රු.8,767,500,000ක අමතර ප්‍රතිපාදන සලසාගත් වැය විෂයන් 03ක සියයට 44ත් 49ත් අතර වියදම් නොකර ඉතිරිකර තිබුණි.	නව කොමිෂන් සභා කාර්යාල සඳහා උපකරණ මිලට ගැනීමට අමතර ප්‍රතිපාදන සලසා ගත්තද, වසා දැමූ අංශවල භාණ්ඩ අවශ්‍යතාවයන් සහිත අංශවලට නිකුත් කිරීම හා අයවැය චක්‍රලේඛ 01/2024 ප්‍රකාරව මිලදී ගැනීම් සීමා කිරීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වී ඇත. 2024 වර්ෂයේදී මැතිවරණ පැවැත්වීම හේතුවෙන් රාජ්‍ය නිලධාරීන් මැතිවරණ රාජකාරීවල නියැලීම හා මැතිවරණ නීතිරීති ප්‍රකාරව කටයුතු කිරීම සහ 2024 වර්ෂය තුල පැවති අයහපත් කාලගුණික තත්ත්වයන් නිසා සැලසුම් පරිදි අදාල ආයතනවලට ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමට බාධාවන් පැන නැඟී	එම

තිබුණි. නව පරිපාලනය කිසිදු ව්‍යාපෘතියක් අවිච්ඡේද නොකල යුතු බවට තීරණය කිරීම නිසා ආයතන විසින් 2024 වර්ෂය තුළ අවසන් කළ හැකි ව්‍යාපෘති පමණක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත.

3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නිරීක්ෂණය		ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
නීති, රීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම		
1986 අංක 04 දරණ ජනාධිපතිවරුන්ගේ හිමිකම් පනතේ 3(2) වගන්තිය	හිටපු ජනාධිපතිවරු හතරදෙනෙකු සඳහා ලබාදිය හැකි උපරිම නිල වාහන සංඛ්‍යාව ඉක්මවා අයෙකුට වාහන 03 සිට 14 දක්වා එකතුව වාහන 38 ක් 2025 ජනවාරි මස දක්වා වැඩිපුර ලබාදී තිබුණි.	එක් රථයක් අටවන විධායක ජනාධිපතිතුමාගේ විධායක නියෝගය අනුව ලබා දීම සිදු කර ඇත. ජනාධිපති කාර්යාලය වෙතින් විශ්‍රාමික ජනාධිපතිවරුන් 04 දෙනෙකු හා වැන්දඹු ජනාධිපති ආර්යාවන් වෙත වාහන 52 ක් අනුයුක්ත කර තිබී ඇත. එහෙත් ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛ අංක පීඑස්/සීඑස්ජ්/00/1/4/12 හා 2025.01.21 දිනැති චක්‍රලේඛය අනුව වර්තමානයේදී උපරිම වාහන 02 ක් වන ලෙස ඔවුන් වෙත හිමි වාහන ප්‍රමාණය පමණක් විශ්‍රාමික ජනාධිපතිවරුන්ට හා වැන්දඹු ජනාධිපති ආර්යාවන් වෙත අනුයුක්ත කර ඇත.	පනතේ උපදෙස් වලට අනුකූල වන පරිදි කටයුතු කළ යුතුවීම.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) සංවර්ධන මූලාරම්භ සම්බන්ධීකරණ සහ අධීක්ෂණය (001-2-06-003-2509) යටතේ ව්‍යාපෘති 11,234 ක් අනුමතකර තිබූ අතර 2024 දෙසැම්බර් 31 ට ඉන් ව්‍යාපෘති 3,544ක් හෙවත් අනුමත ව්‍යාපෘතිවලින් සියයට 32ක් අවලංගුකර තිබුණි. දිස්ත්‍රික්ක හතක අනුමත ව්‍යාපෘති වලින් සියයට 50 කට වඩා ව්‍යාපෘති අවලංගුකර තිබුණි.	ජනාධිපතිවරණය සහ පාර්ලිමේන්තු මැතිවරණය නිසා රාජ්‍ය නිලධාරීන් මැතිවරණ රාජකාරිවල නියැලීම, මැතිවරණ නීතිරීති ප්‍රකාරව කටයුතු කිරීම සහ අධික වර්ෂාව වැනි අයහපත් කාලගුණය හේතුවෙන් සැලසුම් කල පරිදි ව්‍යාපෘතීන් ක්‍රියාත්මක නොවීම ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව ඉතිරි ප්‍රතිපාදන ජනාධිපති කාර්යාලය වෙත පවරා දී ඇත. ජනාධිපති ලේකම්ගේ 2024.11.11 දිනැති ලිපිය අනුව, 2024 වර්ෂයේ සියළුම ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය	සැලසුම් කළ පරිදි සංවර්ධන ව්‍යාපෘති නිම කිරීමට කටයුතු කළ යුතුවීම.

			2024.11.30 දිනට පෙර අවසන් කළ යුතු වීමත්, 2024.12.15 දිනට පෙර සියළුම බිල්පත් ගෙවීම් කටයුතු අවසන් කළ යුතුවීමත් හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් කාලයක් නොමැති ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ආයතන විසින් අවලංගු කිරීමට කටයුතු කර ඇත. කිසිදු ව්‍යාපෘතියක් අවිච්ඡේද නොකළ යුතු බවට ජනාධිපති කාර්යාලයීය නව පරිපාලනය විසින් තීරණය කිරීම නිසා 2024 වර්ෂය තුළ අවසන් කළ හැකි ව්‍යාපෘති පමණක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත.	
(ආ)	2024 දෙසැම්බර් 31 දිනට ප්‍රගති වාර්තා අනුව සංවර්ධන මූලාරම්භ සම්බන්ධීකරණ හා අධීක්ෂණය සඳහා මුලතිව් දිස්ත්‍රික්කයේ අනුමත ප්‍රතිපාදන රු. 24,572,787 ක්වූ ව්‍යාපෘති 04 ක වැඩ ආරම්භ කර අත්හිටුවා තිබුණි.		එම	එම
(ඇ)	වතුකරයේ ජනතාවට ඉඩම් අයිතිය ලබාදීම (වැය විෂය 001-2-06-022-2509) සඳහා වූ 2024 දෙසැම්බර් 31 දිනට ප්‍රගති සාරාංශය අනුව දිස්ත්‍රික්ක හයක අනුමත ව්‍යාපෘති සංඛ්‍යාවෙන් සියයට 61ත් 86ත් අතර පරාසයකින් ව්‍යාපෘති 748ක වැඩ අවසන් කර නොතිබුණි.		එම	එම
(ඈ)	තරුණ අභිවෘද්ධි වැඩසටහන (වැය විෂය 001-2-06-29-2504) යටතේ අනුරාධපුර හා රත්නපුර දිස්ත්‍රික්ක සඳහා අනුමත වී තිබූ ව්‍යාපෘති සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අවසන් කර නොතිබුණි. ඒ සඳහා පිළිවෙලින් රු.මි.25.4ක් සහ 2.45ක් ප්‍රතිපාදන අනුමත කර තිබුණි. අම්පාර දිස්ත්‍රික්කයේ අනුමත ව්‍යාපෘති 248න් ව්‍යාපෘතීන් 156ක් හෙවත් අනුමත ව්‍යාපෘති සංඛ්‍යාවෙන් සියයට 63ක වැඩ අවසන් කර නොතිබුණි.		එම	එම
(ඉ)	තරුණ අභිවෘද්ධි වැඩසටහන සඳහා නුවරඑළිය දිස්ත්‍රික්කයට අනුමත ව්‍යාපෘති නොතිබුණ ද එම දිස්ත්‍රික්කය සඳහා රු.මි.29ක ප්‍රතිපාදන ලබාදී රු.මි.0.335ක් නුවරඑළිය දිස්ත්‍රික්කයේ ක්‍රීඩා සමාජ සඳහා ක්‍රීඩා භාණ්ඩ හා		තරුණ අභිවෘද්ධි වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජනා කළ වතුකරයේ ලියාපදිංචි ක්‍රීඩා සමාජ සඳහා ක්‍රීඩා උපකරණ ලබාදීමේ ව්‍යාපෘතිය ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මගින් අනුමත කරන ලද ව්‍යාපෘති	එම

	ක්‍රීඩා උපකරණ ලබාගැනීමට පුවත්පත් දැන්වීම් පලකිරීම සඳහා දරා තිබුණි. තරුණ අභිවෘද්ධිය සඳහා කිසිදු මුදලක් යොදවා නොතිබුණි.	ක්‍රියාත්මක කිරීම සඳහා නුවරඑළිය දිස්ත්‍රික්කය වෙත රු.29,142,145.00ක ප්‍රතිපාදනයක් ජනාධිපති කාර්යාලය නිකුත් කරන ලදී. ලබාදුන් ප්‍රතිපාදන භාවිතා කර අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීම සඳහා පුවත්පත් දැන්වීම පල කරන ලදී. 2024 වර්ෂයේ පැවති මැතිවරණ දෙක හේතුවෙන් ඊට අදාල ඉතිරි කටයුතු සිදුකිරීමට නොහැකි වූ බවත් නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාචිකව දන්වා ඇත.	
(ඊ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාල 04කට ලබාදී තිබූ එකතුව රු.58,354,990 ක ප්‍රතිපාදන වලින් කිසිදු තරුණ අභිවෘද්ධි වැඩසටහනක් සිදු නොකර සම්පූර්ණ ප්‍රතිපාදන මුදලම ඉතිරිවී තිබුණි.	මෙම දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා ප්‍රතිපාදන වෙන් කලද, මැතිවරණ, අයහපත් කාලගුණය හා සංවර්ධන ව්‍යාපෘති අවිච්ඡේද නොකර වර්ෂය තුලදීම නිම කිරීමට කටයුතු කළ යුතුවූ බැවින් සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.	එම

4.2 ප්‍රධාන කාර්යයන්ට විරුද්ධ ක්‍රියාකාරකම්

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ජනාධිපති කාර්යාලයේ වියදම් ඇස්තමේන්තු තුල ජනාධිපති අරමුදලේ කාර්යයන් සඳහා වැය විෂයක් නොමැති වුවද, සමාලෝචිත වර්ෂයේදී අරමුදලේ ස්ථිර හා තාවකාලික කාර්ය මණ්ඩලය සඳහා වැටුප් හා දීමනා ලෙස රු.47,373,717 ක්, පරිපාලන වියදම් ලෙස රු.16,490 ක්, නඩත්තු වියදම් රු.963,808ක් සහ අනෙකුත් වියදම් ලෙස රු.2,774,063 ක් ලෙස එකතුව රු.51,128,078 ක් කාර්යාලය විසින් ගෙවා තිබූණි.	ජනාධිපති අරමුදලෙන් දැරීම තුළින් ජනතාවට සහන සැලසීම සඳහා පවතින අරමුදල සීමාවේ. ඒ අනුව, මහජනතාවට උපරිම සුභසාධන පහසුකම් සැපයීම අරමුණු කරගනිමින් ජනාධිපතිවරයාගේ අරමුදලට අදාල පරිපාලන වියදම් ජනාධිපති කාර්යාලය විසින් දරා ඇත.	වියදම් ඒකකයන් නිවැරදිව හඳුනාගෙන වියදම් දැරිය යුතුවීම.

4.3 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ජනාධිපති කාර්යාලය නමින් ලියාපදිංචි කර ඇති නමුත් භෞතික පැවැත්ම තහවුරු කරගත නොහැකි වූ වාහන 29 ක් 2025 ජුනි 09 දින වනවිට පැවතුණි. මෙම වාහන	අදාල වාහන 29 හි භෞතික පැවැත්ම තහවුරු කර ගැනීම සඳහා ඒ පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතී. එම පරීක්ෂණ කටයුතු මේ වන	වත්කම් වල භෞතික පැවැත්ම තහවුර කර ගැනීමට

	අතුරුදහන් වීම හෝ කිසියම් ආයතනයකට / පුද්ගලයෙකුට භාරදුන් බවට හෝ කිසිදු ලිඛිත සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	විටත් අවසන් වී නොමැත.	කටයුතු කළ යුතුවීම
(ආ)	2024 වර්ෂය තුලදී ජනාධිපති කාර්යාලයේ වාහන අලුත්වැඩියාව සඳහා දරණ ලද සමස්ථ වියදම රු.645,336,774ක් වූ අතර එම වර්ෂය තුලදී එකම වාහනය අලුත්වැඩියා වාර 10 සිට 17 දක්වා වූ පරාසයක් තුල අලුත්වැඩියා කිරීම් අවස්ථා 53 ක් නිරීක්ෂණය විය. තවද, විගණනය වෙත ලැබී ඇති තොරතුරු අනුව, රු. මිලියනය 1- 40 අතර තක්සේරු වටිනාකමින් යුතු වාහන 189ක් සඳහා 2024 වර්ෂය තුලදී වාහනයකට සඳහා රු.මිලියන 01-28ක් දක්වා පරාසයකින් අලුත්වැඩියා කිරීම සඳහා වියදම් දරා තිබුණි.	ජනාධිපති කාර්යාලය සතු වාහන වලින් වැඩි ප්‍රමාණයක් 2016 ට පෙර නිෂ්පාදිත වාහන වන අතර, එම වාහන මේ වන විට වසර 10ක් හෝ ඊට වඩා පැරණි හා දීර්ඝ කාලයක් භාවිතා කර ඇති වාහන වන බවත් එම වාහන රාජකාරී අවශ්‍යතාවය මත අඛණ්ඩව රාජකාරී සඳහා යෙදවීමට අවශ්‍ය වේ. එම වාහන භාවිතා කරනු ලබන නිලධාරීන්ගේ ආරක්ෂාව පිළිබඳව සලකා ඒවායේ දෝෂ කඩිනමින් අලුත්වැඩියා කිරීමට කටයුතු කිරීම අත්‍යාවශ්‍ය වන බැවින් සියලුම නඩත්තු කටයුතු යාන්ත්‍රික ඉංජිනේරු හා තාක්ෂණික නිර්දේශ මත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කරමින් සිදු කරනු ලැබේ. වාහනයන්හි ජීව කාලය ඉක්මවා යාමත්, රාජකාරී බහුලත්වය මත නිරන්තරයෙන් භාවිතා කිරීමත් හේතුවෙන් නඩත්තු වියදම ඉහළ ගොස් ඇත.	ප්‍රශස්ත වාහන ඇණියක් පවත්වා ගැනීම හා එහි නඩත්තු පිරිවැය අවම කරගත යුතුවීම

4.4 කළමනාකරණ දුර්වලතා

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය වෙත පවරාගෙන තිබූ වාහන 27ක් තවදුරටත් ජනාධිපති කාර්යාලය සතු වාහන ලෙස දක්වා තිබුණි.	ජනාධිපති කාර්යාලයේ වාහන ලැස්තුවෙන් ඉවත් කිරීමට හා විහාරස්ථාන වෙත පවරා දීමට අවශ්‍ය කටයුතු බුද්ධශාසන අමාත්‍යාංශයේ මැදිහත් වීමෙන් සිදු කරයි. සියලු ලිපි ලේඛන එම වාහන විහාරස්ථාන වෙත භාර දෙන අවස්ථාවේදී බුද්ධශාසන අමාත්‍යාංශය වෙත භාර දී ඇත. මෙම කටයුතු කඩිනමින් අවසන් කිරීම සඳහා 2025.03.14 දිනැතිව බුද්ධශාසන අමාත්‍යාංශ නිලධාරීන් සමඟ සාකච්ඡාකර එම පැවරුම් කටයුතු කඩිනමින් අවසන් කරන ලෙස උපදෙස් ලබාදී තිබුණි.	වත්කම්වල අයිතිය හා පැවැත්ම පිළිබඳව තොරතුරු යාවත්කාලීනව පවත්වා ගතයුතු වීම.

4.5 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	විශේෂ ව්‍යාපෘති අංශයේ රාජකාරි කටයුතු සඳහා කාර්‍යාලය විසින් බෙන්ස් රථයක් ලබාදී තිබූ අතර ප්‍රවාහන අංශයේ වාර්තා අනුව, මෙම රථය ඉන්ධන ලීටරයකින් 6 km ක් ධාවනය කල හැකිය. 2022 නොවැම්බර් සිට 2024 සැප්තැම්බර් දක්වා මෙම රථය 30,689km ධාවනය කර තිබූ අතර, ඒ අනුව ඒ සඳහා ආසන්න වශයෙන් ඉන්ධන ලීටර් 5,150 ක් පමණ අවශ්‍ය වුවද, කාර්යාලයේ ඉන්ධන කූපන්පත් භාවිතා කරමින් මෙම රථයට ඉනධන ලීටර් 7,425ක් එනම් සාමාන්‍ය අවශ්‍යතාවයට වඩා ලීටර 2,300 කට වඩාවැඩිපුර ලබාගෙන තිබුණි.	විගණන නිරීක්ෂණ අනුව රාජ්‍ය දේපළ අයතා ලෙස අවභාවිතා කිරීමක් සිදු වී ඇත්දැයි යන්න නිශ්චය කිරීම සඳහා මුදල් රෙගුලාසි අනුව කටයුතු කිරීමට හා මූලික විමර්ශනයක් සිදු කරනු ලබයි.	ඉන්ධන භාවිතය පිළිබඳ පවතින පාලන ක්‍රම වලට අනුකූලව කටයුතු කළ යුතුවීම
(ආ)	2013 වර්ෂයේදී කාර්යාලය විසින් හිටපු ජනාධිපතිවරයෙකුගේ භාවිතය සඳහා විදේශ සැපයුම් කරුවෙකුගෙන් Mercedes Benz G63 AMG මාදිලියේ රථයක් මිලදී ගෙන තිබූ අතර මෙම මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුගමනය කළ බවට තහවුරු නොවූ අතර කාර්යාලය විසින් මේ සඳහා බ්‍රිතාන්‍ය සැපයුම්කරුට 2013 නොවැම්බර් 14 ණයවර ලිපි මඟින් රු.16,489,711 ක් ප්‍රේෂණය කර තිබුණි. මීට අතිරේකව, 2014 මාර්තු 07 හා මැයි 09 දින වලදී පෞද්ගලික පාර්ශවයක් වෙත නැවත රු.16,250,000ක් ගෙවා තිබූ අතර අදාල පෞද්ගලික පාර්ශවය විසින් එම මුදල විදේශ සැපයුම්කරුට ගාස්තු වශයෙන් ගෙවූ බව දන්වා තිබුණි. කෙසේ වෙතත් එසේ ගෙවූ බවට තහවුරු නොවූ අතර, ණයවර ලිපි කාර්යාලය විසින් විවෘත කර තිබියදී රජයේ මුදල් තෙවන පාර්ශවයකට ගෙවීම සඳහා පදනම විගණනයේදී අනාවරණය නොවුණි. එම පෞද්ගලික පාර්ශවය විසින් මෙම මෝටර් රථය ආනයනය කර කාර්යාලයට ලබාදුන් බවට තහවුරු නොවූ අතර රේගු සටහන්කරය අනුව 2013 නොවැම්බර් 21 දින ශ්‍රී ලංකාවට ලැබී තිබූ රථය 2019 දෙසැම්බර් 10, එනම් වසර හයකට පසුව,	ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානීගේ දැනුම් දීම අනුව මෙම Mercedes Benz G63 AMG රථය මිලදී ගැනීමට අදාලව මිල ගණන් පත් එංගලන්තයේ ලන්ඩන්හි පිහිටි සමාගමක දේශීය නියෝජිත ආයතනය වෙතින් ලබා ගෙන ඒවා හා ඊට අදාළ සෙසු තොරතුරු ඇතුලත් කරමින් මෙම රථය මිලදී ගැනීම සඳහා 2013.10.08 දිනැතිව ජනාධිපති ලේකම් වෙත යොමු කර අනුමැතිය ලැබී ඇත. දේශීය නියෝජිත ආයතනය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව මෙම රථයේ වටිනාකම රු.32,000,000ක් වන අතර ආයතනය විසින් 2013.10.01 දින මෝටර් රථය මිලදී ගැනීමට ගැණුම් මිලෙන් 50% ක් එනම් රු.16,250,000ක මුදලක් අත්තිකාරම් ලෙස ගෙවන ලෙස කරන ලද දැනුම් දීමට අදාළව රු.16,43,975ක් ගෙවා ඇත. එම ආයතනය ස්ටර්ලින් පවුම් 76,500ක් ඉහත රථය මිලදී ගැනීමට	වත්කම් මිලදී ගැනීම් පවත්නා නීති රීති වලට අනුකූල වන පරිදි සිදුකළ යුතුවීම

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබුණි. රේගු සටහන්කරය අනුව මෙම රථයට ආනයන රේගු බදු වශයෙන් ගෙවිය යුතු රු.45,982,438ක් ගෙවීමකින් තොරව නිදහස්කර ගැනීමට අදාල බලධාරීන්ගේ අනුමැතිය විගණනයට තහවුරු නොවූ අතර ගෙවීම්වලට අදාළ වූ ගෙවීම් වවුචර් පත් හා අනෙකුත් ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.
2015.07.24 දින සිට 2025.03.17 දින දක්වා වසර 10 ක කාලයක් තුළ මෙම රථය කිලෝමීටර් 49,950 ක් පමණක් ධාවනය කර තිබූ අතර, විගණනයට ලද තොරතුරු අනුව, අළුත්වැඩියා, නඩත්තු හා වාර සේවා වියදම් ලෙස එම කාලය තුළ එකතුව රු.14,506,876 ක් දරා තිබුණි.

අත්තිකාරම් ගෙවා ඇති බවත්, 2013.11.14 දිනැතිව ස්ටර්ලිං පවුම් 77,000ක් ඉහත මෝටර් රථය මිලදී ගැනීමට ණයවර ලිපියක් මඟින් එංගලන්තයේ පිහිටි ආයතනය වෙත ගෙවීම් කිරීම සඳහා නිකුත් කර ඇති බව ජනාධිපති කාර්යාලයේ පවතින තොරතුරු අනුව නිරීක්ෂණය වේ.

මෙම රථයට අදාලව බදු ගෙවීම හෝ නිදහස් කිරීම සම්බන්ධව ලබා ගත් අනුමැතියක් හෝ වෙනත් තොරතුරු ජනාධිපති කාර්යාලය සතුව නොපවතී.

එසේම 2015.07.24 දින සිට 2025.03.17 දින දක්වා රථයේ අලුත්වැඩියා, වාර සේවා, බැටරි යෙදීම සඳහා රු.14,506,876ක පිරිවැයක් දරා ඇති අතර එම සියලු වියදම් කාර්මික ඉංජිනේරු හා තාක්ෂණික නිර්දේශ මත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කරමින් සිදු කර ඇත.